GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/01/24

# මාධ්‍ය නිවේදනයයි

## වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය පොලොන්නරුව දිස්ත්‍රික්කය

පොලොන්නරුව හිඟුරක්ගොඩ හිටපු පරිපාලන මහජන සෞඛ්‍ය පරික්ෂක ඒ.එම්.එස් බණ්ඩාර යන අය විසින් ආරම්භ කල අර්බුදකාරි සේවා වටපිටාවට මේ වනවිට වර්ෂයකට අධික කාලයක් ගතව ඇත.

ගෞරවනිය වෘත්තියක් වන මහජන සෞඛ්‍ය පරික්ෂක වෘත්තියේ, වෘත්තිය අභිමානය කෙලෙසමින් පොලොන්නරුව ප්‍රදේශයේ ඉහලම දේශපාලන රැකවරණය ලබමින්, ඔහු විසින් දිගින් දිගටම අත්තනෝමතික ලෙස කටයුතු කරමින් සිටී.

රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කල විමර්ශන වලට අනුව බරපතල චෝදනා ගණනාවකට වරදකරු බවට ඔප්පු වී සිටින, රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ වචනයෙන්ම ප්‍රකාශ වූ පරිදි මේ වන විට වැඩ තහනමට ලක් වී සිටිය යුතු මෙම පුද්ගලයාව ආරක්ෂා කිරීමේ කූඨ හා පහත් වැඩ පිලිවෙලක් උතුරු මැද පලාත් සෞඛ්‍ය ලේකම්තුමිය ඇතුළු සෞඛ්‍ය බලධාරින් විසින් අනුගමනය කරමින් සිටින බව පැහැදිලිය.

මෙම පුද්ගලයාට විරුද්ධව විමර්ෂණ කටයුතු කඩිනමින් අවසන් කරන ලෙස මීට පෙර කිහිප වතාවක් අදාල බලධාරින්ට දැන්වුවද එය බීරි අලින්ට වීණා වාදනය කිරීමක් වැනි විය.

ඒ අනුව අකමැත්තෙන් වුවද 2014 ජනවාරි 27 වන සඳුදා දින රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයට අයත් පොලොන්නරුව දිස්ත්‍රික්කයේ සියලුම වෛද්‍යවරුන් වැඩ වර්ජනයක නිරත වෙනු ඇත. එදිනටද විසඳුමක් නොලද හොත් ඉන්පසු නැවත දැනුම් දීමකින් තොරව අඛණ්ඩව වෘත්තිය සමිති ක්‍රියාමාර්ගයකට යොමු වන බව අවධාරණය කරමු.

මේ තුලින් ජනතාවට වන පීඩාව පිලිබඳ වගකීම, වගකීම් විරහිත ලෙස හැසිරෙන පලාත් දේශපාලන හා පරිපාලන බලධාරින් විසින් භාරගත යුතුය.

ස්තුතියි

වෛද්‍ය සුමන් අබේවර්ධන
ලේකම්

| | | | |
|---|---|---|---|
| වැඩි දුර විස්තර : | වෛද්‍ය නවීන් ද සොයිසා | - | 0718582444 |
| | වෛද්‍ය හරිත අළුත්ගේ | - | 0718121619 |
| | වෛද්‍ය සංජීව අමරසිංහ | - | 0714410397 |